**එච්. ඩී. මුණසිංහ එ. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය - මාතර**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1578/2019 (21.01.2020 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ  කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ  එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** එච්.ඩී. මුණසිංහ
**නොතිසි ලත් පාර්ශවය** නම් කල නිලධාරී, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය - මාතර

**පෙනීසිටීම**
අභියාචක - එච්.ඩී. මුණසිංහ
පොදු අධිකාරිය - එච්. පි. කුමාර (ප්‍රාග්ධන  සමුපාකාර බැංකුව - දිස්ත්‍රික්ක  කළමනාකරු)

ජේ. ඩී. නුවන් තරිඳු (ප්‍රාග්ධන  සමුපාකාර බැංකුව - මොරවක කළමනාකරු)

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.02.12 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම - **අමුණා නැත** තීරණය ලබා දුන් දිනය - 2019.02.18 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.03.13<br>2019.04.24 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලා සිටීම පිළිබඳ අභියාචනය ලද බව දැන්වීම **- අමුණා නැත** තීරණය ලබා දුන් දිනය - **ලබා දී නොමැත** |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.05.28 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.02.12 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*"මා විසින් 2009.03.30 දින මොරවක බැංකු ශාඛාවෙන් ලබාගන්නා ලද රු.50,000/= ක ණය මුදල නැවත ගෙවූ ආකාරය දැක්වෙන පරිගණක ගිණුම් වාර්තාවේ සහතික පිටපතක්"*

තොරතුරු නිලධාරියා 2019.02.18 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ,

*"ඔබ විසින් තොරතුරු දන ගැනීමේ ලිපියෙහි ඉල්ලුම් කරන ලද කාල පරිච්ඡේදයට අදාලව සී/ස මාතර දිස්ත්‍රික් ප්‍රාග්ධන සමුපකාර බැංකු සමිතියේ මොරවක ශාඛාවේ 2009.03.30 වන දින ජාතික හැඳුනුම්පත් අංක 620132799ව දරණ ඉහත නම් සඳහන් ඔබ විසින් ලබා ගත රු.50000ක ණය මුදල 2009.03.30 වන දින සිට 2010.09.30 දක්වා ගෙවීම් කල ආකාරය පහත පරිදි වේ.*

*2009.04.30 - රු.6200*

*2009.05.30 - රු.4000*

*2009.08.30 - රු. 8000*

*2009.11.14 - රු. 9500*

*2010.08.14 - රු.6000*

*අපගේ ලිපි ලේඛන අනුව ඉහත තොරතුරු සත්‍ය බව සහතික කරමි."*

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2019.03.13 හා 2019.04.24 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක යොමු කරන ලදී. නම්කළ නිලධාරයා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.05.28 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

2019.10.23 දිනැති ලිපියෙන් පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාව වෙත පහත දැක්වෙන පරිදි ලිඛිත ප්‍රකාශ යොමු කල ඇත.

*"උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක A1911 හා 2019.10.15 දිනැතිව මා වෙත යොමු කරනු ලද ලිපිය හා බැන්දේ.*

*02. ඒ අනුව අදාළ තොරතුරු සැපයු බව දැනුම් දෙන අතර ආවරණ ලිපියේ පිටපතක් මේ සමග ඉදිරිපත් කරමි."*

අභියාචනාව විභාගයට ගන්නා අවස්ථාවේදී පොදු අධිකාරිය විසින් දන්වා සිටියේ අභියාචක විසින් බැංකුවෙන් ලබා ගත ණය මුදල නැවත ගෙවූ ආකාරය දැක්වෙන පරිගණක ගිණුම් වාර්තාවේ සහතික පිටපතක් ඉල්ලුම් කල ඇති නමුත්, එම කාල සීමාව තුල තම ආයතනය මගින් එම ගිණුම් තොරතුරු පරිඝනක ගත කල නොමැති බවත්, පරිඝනක ගත කිරීම ආරම්භ වුයේ 2016 වර්ෂයේ සිට බවත් ය. කෙසේ නමුදු පොදු අධිකාරිය විසින් දක්වා සිටියේ පොදු අධිකාරිය සතුව පවතින අත්පොත් වාර්තාවෙහි පිටපතක් 2019.10.23 දිනැති ලිපියෙන් අභියාචකට ලබා දුන් බවය.

මෙහිදී අභියාචක දක්වා සිටියේ අභියාචක විසින් බැංකුවට ගෙවන ලද සමහර වාරික මෙහි සටහන් වී නොමැති බවත් තමා ළඟ එම ගෙවීම් කල රිසිට්පත් ඇති බව හා එබැවින් අභියාචක මෙම පරිඝනක ගත කල වාර්තා ඉල්ලුම් කල බව ය.

මෙහිදී පොදු අධිකාරිය පවසා සිටියේ මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පොදු අධිකාරියේ මූලිකත්වයෙන් අභියාචකගේ ද සහභාගිත්වයෙන් 2020.01.24 දින පැවැත්වීමට නියමිත බව ය.

**නියෝගය:**

මෙහිදී මෙම වාරික ගෙවීම් සම්බන්ධ ගැටළුවක් පන නැගී ඇති බව නිරීක්ෂණය වුවද මෙම අභ්‍යන්තර ගැටළු විසඳීමට බලතල කොමිෂන් සභාව සතුව නොමැති බව දෙපාර්ශවයටම අවධාරණය කරනු ලැබේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 3 (1) වන වගන්තිය ප්‍රකාරව පුරවැසියන්ට ප්‍රවේශ වීමට අයිතිවාසිකම් හිමි වී ඇත්තේ පොදු අධිකාරියක් සතු ව සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරු වලට ය. ඒ අනුව, පොදු අධිකාරිය සන්තකයේ භාරයේ හෝ පාලනයේ ඇති මෙම ඉල්ලුම් කල ඇති තොරතුරු අභියාචක වෙත 2019.10.23 දිනැති ලිපියෙන්, අත්පොත් වාර්තාවේ පිටපතක් වශයෙන් ලබා දී ඇති බව නිරීක්ෂණය කරනු ලැබේ.

අභියාචක ඉල්ලුම් කල ඇති මාද්‍යයෙන් තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය ට නොහැකි බැවින් හා පොදු අධිකාරිය විසින් ලබා දී ඇති තොරතුරු පනතෙහි 3 වන වගන්තියේ ඇති අවශ්‍යතා සපුරාලන බැවින් අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
*****